## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :- 11 ශ්‍රේණිය **විෂය** :- නර්තනය **අදාළ සතිය** :- පෙබරවාරි මාසය 1 වන සතිය

**2.පාඩම/ ඒකකය:-** තුන් තිතේ ප්‍රභේද දක්වමු

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

- ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායන් වල නර්තන අංග වල තිත් ප්‍රභේද අධ්‍යයනය කරන්න.
- තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබමින් පද කියා පුහුණු වෙන්න.
- කාර්ය පත්‍රිකාව සම්පූර්ණ කරන්න.

- **හිස්තැනට ගැලපෙන පිළිතුර තෝරන්න.**

01. තුන් තිතේ ප්‍රභේද ............. කි.

(1). 4 කි (2). 6 කි (3). 8 කි (4). 10 කි

02. දෙසුළු මැදුම් තුන් තිතේ තාල රූපය ............ වේ.

(1). 2 + 2 + 3 (2). 3 + 3 + 2 (3). 2 + 3 + 2 (4). 3 + 2 + 3

03. තුන් තිතේ තිත් රූපය සෑදීමට.............................................

(1). තිත් 4 ක් ඇත. (2). තිත් 3 ක් ඇත. (3). තිත් 2 ක් ඇත. (4). තිත් 1 ක්ඇත.

04. දෙසුළු මැදුම් තුන් තිතට මාත්‍රා ...................................කි.

(1). 7 (2). 8 (3). 9 (4). 10

05. " ^ ^ / " යන සංකේතවලින් .............................. ලෙස දැක්විය හැකිය.

(1). තෙයි තෙයි තිත් (2). තෙයි තිත් තෙයි (3). තිත් තිත් තෙයි (4). තිත් තෙයි තිත්

(ලකුණු 3 × 5 = 15)

### තුන් තිතේ ප්‍රභේද

මාත්‍රා 2 තානි තිත, මාත්‍රා 3 තානි තිත මාත්‍රා 4 තානි තිත (සුළු, මැදුම්, මහ) යන මූලික තිත් රූප ආශ්‍රයෙන් දේශීය තාල ශාස්ත්‍රයේ විවිධ තිත් රූප ගොඩනැගී ඇත. තිත් රූප තුනක් එකතු වීමෙන් තුන් තිතේ තිත්රූප සෑදී ඇත. ඒ අනුව තුන් තිතේ ප්‍රචලිත තිත් ප්‍රභේද දෙකක් හඳුන්වා දිය හැකි ය.

තුන්තිතේ ප්‍රචලිත තිත් ප්‍රභේද

- දෙසුළු මැදුම් තුන්තිත (මාත්‍රා 2+2+3)
- දෙසුළු මහ තුන් තිත (මාත්‍රා 2+2+4)

තුන් තිතේ තාල ප්‍රභේද ප්‍රස්තාරකරණයේ දී භාවිත කරන සංකේත වන (^) තිත් යන තාල සංඥාව ද තෙයි (/) යන සංඥාව ද එකතු වීම නිසා තිත්, තිත් තෙයි යනුවෙන් භාවිත කෙරේ.

උදා : ^ ^ /
1 2 1 2 1 2 3

තුන් තිතේ තිත් ප්‍රභේදයේ දී ඉහත සඳහන් කර ඇති ආකාරයට අක්ෂර හැඩීම සංකේතවලින් කෙරේ.

උදා : තිත් තිත් තෙයි
^ ^ /

මාත්‍රා 2+2+3 (දෙසුළු මැදුම් තුන්තිත) තාලය

| | ^ | | ^ | | / | | | ^ | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |
| උඩරට | දොම් | තකු | දොම් | තකු | දොං | ජිං | - | ගත් | - | තත් | - | ජිං | තරි | කිට |
| පහතරට | දිත් | - | තම් | - | දි | ත | ම | දොං | - | දොං | - | තා | - | ම |
| සබරගමු | තත් | - | කි | ට | ත | ත | ට | ජි | මි | ත් | කු | දා | | |

| | ^ | | ^ | | / | | | | ^ | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| උඩරට | කු | ද | ග | ත | ග | ත | දොං | - | කු | ද | ග | ත | ග | ත | දොං | - |
| පහතරට | ග | දි | කි | ට | ග | ත | දොං | - | ගු | දි | කි | ට | ග | ත | දොං | - |
| සබරගමු | ජි<br>කු | මි<br>දි | ත<br>ත | ග<br>ග | තා<br>තා | -<br>- | දොං<br>කු | -<br>ද | ජි<br>කු | මි<br>දි | ත<br>ත | ග<br>ග | තා<br>තා | -<br>- | දොං<br>කු | -<br>ද |

**4. ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි පොත් හා ඉගෙනුම් ආධාරක :-**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය
- 11 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත

  You tube නාලිකා :- https://www.youtube.com/watch?v=KyLYIU8BB-U

  https://www.youtube.com/watch?v=qwvqk6_DwnE

**5. අපේක්ෂිත ඉගෙනුම් ඵල:-**

- තුන් තිතේ ප්‍රභේද විස්තර කරයි.
- තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබයි.
- තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබමින් පද කියයි.

සැකසුම :- කෑගල්ල අධ්‍යාපන කලාපය